ANNUAL REPORT 2022

වාර්ෂික වාර්තාව வருடாந்த அறிக்கை

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
தேசிய வடிவமைப்பு நிலையம்
NATIONAL DESIGN CENTRE

කර්මාන්ත අමාත්‍යාංශය
கைத்தொழில் அமைச்சு
Ministry of Industries

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය
2022

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

අන්තර්ගතය

මහ පෙන්වන මූලධර්ම ▪ දැක්ම ▪ මෙහෙවර	01
ආයතනික අරමුණු, හර වටිනාකම් හා තිරසර සංවර්ධනය	02-04
ආයතන පනත හා ලියාපදිංචිය	05
ආයතන කළමනාකාරිත්වය	06
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	07
සභාපතිගේ පණිවිඩය	08
අධ්‍යක්ෂකගේ පණිවිඩය	09
ආයතන ව්‍යුහය	10
මානව සම්පත	11
සංවර්ධන ක්‍රියාකාරකම් හා සේවා සැපයීම	12-27
2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අවසන් ගිණුම්	28-59
2022 ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව	60-66

මහ පෙන්වන මූලධර්ම

දැක්ම -

තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්

මෙහෙවර

ප්‍රවර්ධනය, සංවර්ධනය,

හැකියාවන් ගොඩනැංවීම,

ප්‍රචලිත කිරීම සහ

ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුළින්

වෙළඳපොල පාදක කරගත්

නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම

ආයතනික අරමුණු

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපළ නැමියාවන්ට අනුව නව නිර්මාණ හඳුන්වා දීම.

- සුදුසු තාක්ෂණය හඳුන්වාදීම සහ තත්ත්ව ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණික ආයතන සමඟ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ ගුණාත්මක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා නිසි තාක්ෂණික හා අමුද්‍රව්‍ය සැකසීමේ ක්‍රම හඳුන්වාදීම.

- ආදායම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට, කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට සහ මහජනතාවට අවශ්‍ය දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා සේවාවන් ලබාදීම.

- හස්ත කර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදීම.

- නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳපොළ වැඩිදියුණු කිරීම.

- රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් හා පුහුණු කිරීම් හරහා මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීම.

<u>හර වටිනාකම්</u>

- ❖ අප වගකීමෙන් බැඳී සිටිමු
- ❖ අවංක හා විනිවිදභාවයෙන් යුතු වෙමු
- ❖ නිපුණත්වය හා එකමුතු ප්‍රයත්නයන් විශ්වාස කරමු
- ❖ නව තාක්ෂණය හා අභිරුචිය භාවිතා කිරීමට පෙළඹෙමු
- ❖ හොඳ පාරිභෝගික සේවාවක් ලබා දෙන බවට විශ්වාස කරමු

තිරසාර සංවධර්න අරමුණු ඉටුකර ගැනීම සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය

එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු 17 සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය යටතේ සේවා සපයන රාජ්‍ය ආයතනයක් වන ජාතික මෝස්තර මධ්‍යස්ථානයට ආවේණික වූ අරමුණ වන්නේ එයින් අටවැන්නයි.

එනම්,**Decent Work and Economic Growth** - තිරසාර පරිපූර්ණ ආර්ථික වර්ධනයක් සුරක්ෂිත කිරීම, පූර්ණ හා ඵලදායීත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම, සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම.

ඒ යටතේ

8.2 - විවිධාංගීකරණය, තාක්ෂණය ඉහල නැංවීම සහ නවෝත්පාදනය තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයන් ලබා ගැනීම.

8.3- ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම, මූල්‍ය සේවාවන්ට ප්‍රවේශවීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම.

8.4 - සම්පත් උපයෝජනය කාර්යක්ෂම කිරීම සහ ආර්ථික සංවර්ධනයේදී පරිසරයට හානි සිදුවීම නැවැත්වීමට ක්‍රියාමාර්ග ගැනීම.

8.5 - 2030 වන විට ආබාධිත පුද්ගලයින් හා යෞවනයන්ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථා ලබාදීම.

යන උප අරමුණු ඉටුකරගැනීමට අදාළ පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමටජාතික මෝස්තර මධ්‍යස්ථානය වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇත.

- තෝරාගත් හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන පරිදි රට පුරා ගුණාත්මක පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම.

- කාන්තාවන්ට වැඩි වශයෙන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවීමට අවස්ථාව ලබාදීම තුළින් ඔවුන්ට අමතර ආදායමකට හෝ ස්වයං රැකියාවකට මාර්ගය සැලසීම.

- ජාතික ආර්ථිකය වෙත ආකර්ෂනය කරගැනීමට හැකිවන අයුරින් විශේෂ අවශ්‍යතා සහිත කණ්ඩායම් සඳහා හස්ත කර්මාන්ත පුහුණුව සැලැසීම.

- හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ලාභදායී, වඩාත් සුදුසු පද්ධති හඳුන්වාදීම සහ පුළුල් කිරීම.

- නව නිපැයුම්, නව තාක්ෂණයන්, නව යන්ත්‍රෝපකරණ හා මෙවලම් හඳුන්වා දීම තුලින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය නවීකරණය හා වැඩිදියුණු කිරීම.

- හස්ත කර්මාන්ත සඳහා භාවිතා කළහැකි විකල්ප අමුද්‍රව්‍ය දියුණු කිරීම සහ පූර්ව ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම.

- සුනිසි රැකියා පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ ඒ සම්බන්ධයෙන් පුහුණු කිරීම් පැවැත්වීම.

- වෙළඳපළට ගැලපෙන පරිසර හිතකාමී නව නිර්මාණ, නවෝත්පාදන ඇසුරුම් සහ සිහිවටන නිර්මාණ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වාදීම.

- හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වාදුන් නව නිර්මාණ දේශීය හා විදේශීය වෙළඳපොළට හඳුන්වාදීමට කටයුතු කිරීම හා ඒ හරහා හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ආර්ථිකය නඟාසිටුවීම.

- සාධාරණ ලාභ පදනමක් මත වෘත්තීය අධ්‍යාපන වැඩසටහන්, පුහුණු සහ උපදේශන සේවා පැවැත්වීම තුළින් තරුණ කණ්ඩායම්හි නිර්මාණශීලී හැකියාව වැඩිදියුණු කිරීම හා වෘත්තීය මාර්ගෝපදේශය ලබාදීම.

ආයතන පනත හා ලියාපදිංචිය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද, මේ වන විට බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශීය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය නංවාලීම තුළින් ශිල්පීන්ගේ අභිවෘද්ධිය මූලික අරමුණ කරගත් ව්‍යවස්ථාපිත ආයතනයකි.

සංවිධානය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, සමස්ත හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිය අරමුණු ඉටු කරගැනීමට නිරතුරුව ක්‍රියාත්මක වී සිටී. මෙහිදී මොරටුව, කටුබැද්ද, ද මෙල් පාර, අංක 10 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වයෙන් හා මධ්‍යම පළාත ආවරණය කරමින් මහනුවර, කලාපුරය නත්තරම්පොත පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ සහයෝගයෙන් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් හස්ත කර්මාන්ත ශිල්පීන් නඟා සිටුවීමට කැපවී සිටී.

මීට අමතරව, ඩිප්ලෝමා පාඨමාලා හරහා නව නිර්මාණකරුවන් බිහි කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන ජාතික පිරිනිර්මාණ අධ්‍යන ආයතනය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර ඒ මඟින් නිර්මාණශීලි හැකියාවන් ඇති තරුණ තරුණියන්ට ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා වෘත්තීය දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව ලබා දී ඇත.

එමෙන්ම, නත්තරම්පොත ශාඛා කාර්යාලය තුළ ස්ථාපිත පිත්තල, ලාක්ෂා, බතික් හා සම් ආශ්‍රිත වැඩහල හා පොදු පහසුකම් මධ්‍යස්ථානය මඟින් හස්ත කර්මාන්ත ශිල්පියාට අඛණ්ඩ සේවාවක් සපයයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිය දැක්ම ප්‍රධාන කොට ක්‍රියාත්මක මෙහෙවර තුළින් තම අරමුණු ඉටු කිරීමේදී ප්‍රධාන කර්යාලයේ මූලිකත්වය ඇතිව හා නත්තරම්පොත පිහිටි ශාඛා කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ මහපෙන්වීමත්, පවතින අනෙකුත් සහෝදර ආයතන මෙන්ම පළාත් සභා හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හි නියැලෙන ස්වෙච්ඡා සංවිධාන, හස්ත කර්මාන්තකරුවන් සහ වෙනත් බාහිර ආයතන ද ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිරතුරුව සම්බන්ධ වේ.

සියලුම පරිපාලන, මූල්‍ය, අලෙවි ප්‍රවර්ධන , මෝස්තර සංවර්ධන, මෝස්තර අධ්‍යාපන, පර්යේෂණ හා තාක්ෂණික සංවර්ධන යන ක්ෂේත්‍රයන්ට අදාල කාර්යයන් ද පොදු පහසුකම් හා පුස්තකාල සේවා සැපයීම ආදී ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකිරීමට අදාල සියලුම කාර්යයන් ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරන අතර, පරිපාලන, මූල්‍ය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු හැර අනෙකුත් සියලු කටයුතු නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය මඟින් ද ඉටු කෙරේ.

(i) ප්‍රධාන කාර්යාලය - අංක10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව.

දුරකථන / ෆැක්ස් අංක - 011-2607114 - සභාපති

011-2626345 - අධ්‍යක්ෂ

011-2607814 - පොදු

ෆැක්ස් 011-2607111

ඊ මේල් info@slndc.gov.lk

(ii) නත්තරම්පොත ව්‍යාපෘතිය - කලාපුරය, නත්තරම්පොත

කාර්යාලය සහ වැඩහල දුරකථන අංකය / ෆැක්ස් - 081-2420038

අධ්‍යක්ෂ මණ්ඩලය

1)	අජිත් ජයවර්ධන මයා	-	සභාපති - 2022.12.05 දක්වා
2)	ඩබ්.ජී.කේ.බී. රණතුංග මයා	-	සභාපති - 2022.12.06 සිට
3)	චන්ද්‍රිකා සේනානායක මිය	-	භාණ්ඩාගාර නියෝජිත - 2022.03.01 දක්වා
4)	ඩී.එච්.එස්. පුල්ලප්පෙරුම මිය	-	භාණ්ඩාගාර නියෝජිත - 2022.03.02 සිට
5)	පී.ජී.පී.රසාංජලී මිය	-	භාණ්ඩාගාර නියෝජිත - 2022.09.01 සිට
6)	ඊ. ඩී. සී. සම්පත් ඇරැහැපොල මයා	-	ස්වාධීන
7)	ලක්මාල් වික්‍රමාරච්චි මයා	-	ස්වාධීන
8)	ඩෙන්සිල් ඉන්ද්‍රජිත් පෙරේරා මයා	-	ස්වාධීන
9)	ආනන්ද ජයසිංහ මයා	-	ස්වාධීන
10)	එස්.එම්. අබේරත්නමයා	-	ස්වාධීන
11)	හෂිනි සිල්වා මිය	-	ස්වාධීන
12)	නන්දනී සමරවික්‍රම මිය	-	අමාත්‍යාංශ නියෝජිත

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

1)	අජිත් ජයවර්ධන මහතා	-	සභාපති - 2022.12.05 දක්වා
2)	ඩබ්. ජී. කේ. බී. රණතුංග මයා	-	සභාපති - 2022.12.06 සිට
3)	පී.කේ.එන්. අසංගිකා මිය	-	අධ්‍යක්ෂ(වැ.බ) /සහකාර අධ්‍යක්ෂ (පාලන) 2021.06.01 සිට
4)	එම්.ඒ.එස්.ගම්ලත් මිය	-	සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) බස්නාහිර පළාත/ අංශ ප්‍රධානී
5)	පී. කේ. විජේසිංහ මහතා	-	සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) මධ්‍යම පළාත
6)	බී. මනතුංග මහතා	-	සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) උතුරු මැද සහ වයඹ පළාත
7)	තමරා දමයන්ති මිය	-	සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) ඌව සහ සබරගමු
8)	ඩබ්.එම්. පියරත්න මහතා	-	සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන)
9)	බී. ආර්. රණවීර මිය	-	ගණකාධිකාරි
10)	එන්. ජී. කේ. ඉන්දික මහතා	-	සහකාර අධ්‍යක්ෂ (අලෙවි)
11)	බී. ඒ. එන්. එන්. බමුණුසිංහ මිය	-	සහකාර අධ්‍යක්ෂ (රසායනික)
12)	ටී.එම්.ටී.ටී.තිලකරත්න මයා	-	සහකාර අධ්‍යක්ෂ (යාන්ත්‍රික) 2022.04.01 සිට

බැංකුකරුවෝ

ලංකා බැංකුව , කටුබැද්ද

මහජන බැංකුව, කටුබැද්ද

විගණනය

රජයේ විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

සභාපතිගේ පණිවිඩය

කර්මාන්ත අමාත්‍යාංශයෙහි බතික් අත්යන්ත්‍ර හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලාංකීය හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛව ක්‍රියාකරන ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2022 වසරේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මහත් ගෞරවයක් ලෙස සලකමි.

2022 වසරේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම, අලෙවි සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම මෙන්ම ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය මගින් පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලාවන් සාර්ථකව නිමා කරන ලද සිසුන් 70 දෙනෙකුට සහතික ප්‍රදානය කිරීමද සිදුකරන ලදී.

මීට අමතරව ජාතික රූපවාහිනියේ සහාය ඇතිව අත්කම් නිර්මාණකරනය පිළිබඳ වැඩසටහන් මාලාවක් පැවැත්වීම, පාසැල් සිසුන් නිර්මාණකරණයට පෙළඹවීමේ අරමුණු සහිතව 'ස්මාර්ට් ආර්ට්' චිත්‍ර තරඟය පැවැත්වීම සහ වෘත්තීය පුහුණු අධිකාරිය සමග ඒකාබද්ධව රෙදි හැඩගැන්වීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම යනාදිය 2022 වසරේදී ක්‍රියාත්මක කරන ලදී.

මෙම වසර තුළදී ක්‍රියාකාරී සැලැස්ම යටතේ භාවිතා කරන උපාය මාර්ග නවීකරණය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර ආයතනික පනත සක්‍රීයව ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් දේශීය නිෂ්පාදන ඉහල නැංවීම සඳහා වෙළඳපොළ පුලුල් කිරීමට, නව විදේශ වෙළඳපොලට ප්‍රවේශ වීමට අවශ්‍ය නිර්මාණාත්මක සහාය ලබාදීම, නව නිර්මාණ වෙළඳපොල වෙත හඳුන්වාදීම, දැනුම හුවමාරු කිරීම, ශිල්පීන් හා නිර්මාණකරුවන් සඳහා අවශ්‍ය කරන පහසුකම් සම්පාදනය කිරීම සහ ප්‍රමිතිකරණයට ලක් කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කරන ලදී.

2023 හා 2024 යෝජිත ක්‍රියාකාරී සැලැස්මට පරිබාහිරව කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලබන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කර ඉදිරිපත් කරන ලදී.

2022 වර්ෂයේ ඉලක්කගත ප්‍රගතිය කරා ළඟාවීමට ඉතාමත් කැපවීමෙන් වැඩකළ ප්‍රධාන කාර්යාලයේ සහ නත්තරම්පොත කාර්යාලයේ සමස්ත කාර්ය මණ්ඩලයටද මේ සඳහා අවශ්‍ය සහාය සහ මගපෙන්වීම ලබාදුන් රේඛීය අමාත්‍යාංශයේ නිළධාරීන් සහ රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ටද මාගේ හෘදයාංගම ස්තූතිය මෙසේ පුද කරමි.

ඩබ්.ජී.කේ.බී. රණතුංග,

සභාපති,

ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

අධ්‍යක්ෂකගේ පණිවිඩය

2022 වර්ෂයේද අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන් එහි කටයුතු වල වැඩ බැලීම මා වෙත පැවරෙන ලදී. කොවිඩ් වසංගත තත්ත්වය යම්තාක් දුරකට පහව ගිය නමුත් රටතුළ පැවති ඉන්ධන හා ප්‍රවාහන ගැටළුව ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහිලා මහත් අභියෝගයක් වුනි.

කෙසේ වුවත් ජාතික රූපවාහිනියේ (නුග සෙවණ වැඩසටහන) සහාය ඇතිව රටපුරා විසිරී සිටින හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇල්මක් ඇති පාර්ශවයන්ට විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ වැඩසටහන් සිදුකිරීමෙන් අවශ්‍ය දැනුම ලබාදී පෙරටත් වඩා ආයතනය හා එහි කාර්යයභාරය රටපුරා ප්‍රචලිත කිරීමට හැකියාව ලැබුණි.

ශ්‍රී ලංකා දකුණු ආසියානු හවුල්කාරිත්වය (South Asia Partnership Sri Lanka) හා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සමඟ ඒකාබද්ධව ගුරු ශිල්පීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් (TOT) පැවැත්වීමට හැකිවිය. ලෝක ළමා දිනය ඉලක්ක කර ගනිමින් ප්‍රථම වතාවට පාසල් ක්ෂේත්‍රය සඳහා අත්කම් සහ කලාව හදුන්වාදීමේ අරමුණ ඇතිව “ස්මාර්ට් ආර්ට් චිත්‍ර තරගය” පැවැත්වීමටත් ජයග්‍රාහකයින්ට ත්‍යාග ප්‍රදානෝත්සවයක් පැවැත්වීමටත් භාග්‍ය ලැබුණි.


එමෙන්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඇසුරුම්කරණ ව්‍යාපෘතිය යටතේ එකිනෙකට වෙනස් වූ සුවිශේෂී ඇසුරුම් නිර්මාණ 122ක් එළිදැක්වීමට හැකි වූ අතර, ක්‍රියාකාරී සැලැස්ම යටතේ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය උදෙසා මෝස්තර අංශය හරහා නව නිර්මාණ 354ක් බිහි කිරීමට හැකිවිය.

මෙම වසර තුළ ආයතනයේ යටිතල පහසුකම් දියුණු කිරීම යටතේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන තුළින් වැඩහල තුළ දූවිලි බැහැර කිරීමේ පද්ධතියක් සකසා ගැනීමටද අවස්ථාව ලැබුණි.

සේවක පුරප්පාඩු හා ප්‍රායෝගික අභියෝග රැසක් හමුවේ ආයතනයේ භෞතික හා ගුණාත්මක ප්‍රගතිය සාක්ෂාත් කරගැනීමට නිරන්තරයෙන් අමාත්‍යාංශයේ ලද මහපෙන්වීමේ සහ සභාපතිතුමන් හා ආදරණීය කාර්යය මණ්ඩලයට මාගේ ගෞරවය හා ස්තූතිය පුදකර සිටීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

නිෂාමී අසංගිකා,
අධ්‍යක්ෂ (වැ.බ),
ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

ආයතන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ
HM 1-3
MM 1-1
JM 1-1
MA 5-1
MA 3
MA 2-1
MA 1-1
PL 3
PL 1
ස.අ/නි.අ (මෝස්තර සංවර්ධන) (අංශ ප්‍රධානි/පළාත්)
ස.අ/නි.අ. (අලෙවි)
ස.අ/නි.අ. (රසායනික)
ස.අ/නි.අ. (නත්තරම්පොත)
ස.අ/නි.අ. (යාන්ත්‍රික)
ස.අ/නි.අ. (පාලන)
ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
මෝස්තර පුහුණු සම්බන්ධීකරණ නිලධාරී
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරී
ගිණුම් නිලධාරී
මෝස්තර සම්පාදක
වැඩසටහන් සම්බන්ධීකාරක
මෝස්තර සම්පාදක
සංවර්ධන සහකාර
අලෙවි සහකාර
සංවර්ධන සහකාර
පුස්තකාල හා තොරතුරු සහකාර
සංවර්ධන සහකාර
පෞද්ගලික සහකාර.
පෞද්ගලික සහකාර.
ශිල්ප උපදේශක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
ශිල්ප උපදේශක
කළමනාකර ණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
රියැදුරු
රියැදුරු
කාර්යාල සහායක / මුරකරු
කාර්යාල සහායක / මුරකරු

මානව සම්පත

තනතුරු නාමය	සේවා ගණය	අනුමත	පවතින	පුරප්පාඩු
අධ්‍යක්ෂ	HM 1-3	01	-	01
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන)	MM 1-1	06	05	01
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	MM 1-1	01	01	-
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (යාන්ත්‍රික)	MM 1-1	01	-	01
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (රසායනික)	MM 1-1	01	01	-
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි)	MM 1-1	01	01	-
ගණකාධිකාරි	MM 1-1	01	01	-
පරිපාලන නිලධාරි	JM 1-1	02	-	02
ගිණුම් නිලධාරි	JM 1-1	02	01	01
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක	JM 1-1	04	04	-
අභ්‍යන්තර විගණන නිලධාරි	JM 1-1	01	01	-
මෝස්තර පුහුණු සම්බන්ධීකරණ නිලධාරි	JM 1-1	01	01	-
සභා ලේකම්	JM 1-1	01	-	01
අලෙවි නිලධාරි	JM 1-1	01	-	01
මෝස්තර සම්පාදක	MA 5-1	09	03	06
වැඩසටහන් සම්බන්ධීකාරක	MA 5-1	01	-	01
පුස්තකාල හා තොරතුරු සහකාර	MA 3	01	-	01
සංවර්ධන සහකාර	MA 3	03	01	02
අලෙවි සහකාර	MA 3	01	-	01
පෞද්ගලික සහකාර	MA 2-1	02	01	01
කළමනාකරණ සහකාර	MA 1-1	13	08	05
ශිල්ප උපදේශක	MA 1-1	32	27	05
රියදුරු	PL 3	06 01 contract	06	01 contract
කාර්යාල සහායක	PL 1-1	17	13	04
මුරකරු	PL 1-1	04	03	01
එකතුව		**114**	**78**	**36**

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය - 2022

2022 වර්ෂය සඳහා අනුමත මිලියන 40ක ප්‍රතිපාදන යටතේනිදහස් කරන ලද රු. මි. 20.035 ක ප්‍රතිපාදන යොදාගනිමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියාකාරී සැලැස්මට අනුව සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කොට ඇති අතර, එහි භෞතික ප්‍රගතිය පහතින් දක්වා ඇත. එහි මූල්‍ය ප්‍රගතිය රු. මි. 9.576ක් වේ.

ක්‍රියාකාරී සැලැස්ම හරහා සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් වලට අමතරව, ශ්‍රී ලංකා දකුණු ආසියානු හවුල්කාරිත්වය (South Asia Partnership Sri Lanka) සමග ඒකාබද්ධව අප විසින් ගුරු ශිල්පීන් (TOT) සඳහා සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සඳහා අගය වැඩි කිරීමේ ව්‍යාපෘතියක් හා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සමග ඒකාබද්ධව රෙදි හැඩ ගැන්වීම පිළිබඳපුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක්ද පවත්වන ලදි.

එමෙන්ම,රටපුරා විහිදී පැතිරී සිටින අත්කම් නිර්මාණ ශිල්පීන්ගේ පුහුණු අවශ්‍යතාවයන් කෙරෙහි යොමු වෙමින් ජාතික රූපවාහිනියේ (නුගසෙවණ වැඩසටහන) සහාය ඇතිව අප විසින් රූපවාහිනි වැඩසටහන් මාලාවක් පවත්වන ලද අතර රට තුළ පවත්නා ඉන්ධන අර්බුදය සහ වර්තමාන අහිතකර ආර්ථික තත්ත්වය හේතු කොට ගෙන මෙය ඔවුන්ට ස්වර්ණමය අවස්ථාවක් විය.

ස්මාර්ට් ආර්ට් චිත්‍ර තරගය - පාසල් ක්ෂේත්‍රය සඳහා අත්කම් සහ කලාව හඳුන්වාදීමේ හා නිර්මාණකරණ ක්ෂේත්‍රය කෙරෙහි අනාගත පරපුර යොමු කරවීම දිරිමත් කිරීමේඅරමුණ ඇතිව ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් චිත්‍ර තරගයක් සංවිධානය කරන ලද අතර, ලෝක ළමා දිනය ඉලක්ක කර ගනිමින් ඔක්තෝම්බර් 01 වන දින ජයග්‍රාහී චිත්‍ර ප්‍රදර්ශනය හා ත්‍යාග ප්‍රදානෝත්සවය ජාතික මෝස්තර මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඇටිලස් ආයතනය සහ තවත් ආයතන කිහිපයක අනුග්‍රහය ලබා ගැනීමට හැකි විය.

ඒමෙන්ම, අමාත්‍යාංශ ප්‍රතිපාදන රු. මි.3.7 ක් අප ආයතනය වෙත ලබාදීම හරහා පහත සඳහන් ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබුණි.

ජාතික වශයෙන් ආරම්භ වූ දේශීය අමුද්‍රව්‍ය සමඟ තිරසාර ඇසුරුම් ප්‍රවර්ධනය කිරීමේ නව ඇසුරුම් නිර්මාණ ව්‍යාපෘතියට සම්බන්ධ වෙමින් ඉහල දායකත්වයක් දැක්වීමට අවස්ථාව ලැබුණු අතර, ඒ හරහා පවත්වන ලද ප්‍රදර්ශනය සඳහා අප ආයතනය විසින් සැලසුම් කරන ලද නව ඇසුරුම් නිර්මාණ 122 ක් එළි දැක්වීමට කටයුතු කරන ලදි.

ඒමෙන්ම, ආයතනයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත වැඩහල සඳහා පිරිවැය සඵලදායී, යෝග්‍ය, දුහුවිලි බැහැර කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි

නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධනය

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල දේශීය හා විදේශීය වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධානතම කාර්යයක් වන අතර, එම නිර්මාණයන්හි මූලික සාම්පල (මූලාදර්ශ) ආයතනයේ වැඩහල තුළ සකස් කරනු ලැබේ. එසේ සකස් කරනු ලබන නව නිර්මාණ හා සාම්පල් භාණ්ඩ දිවයින පුරා සිදු කෙරෙන පුහුණු වැඩසටහන් ඔස්සේ හස්ත කර්මාන්ත ශිල්පීන්ට හඳුන්වා දීමට කටයුතු කරන අතර, හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ඉල්ලීම් මත ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි නව නිර්මාණ සැලසුම් කර දීමට ද ආයතනයේ මෝස්තර සංවර්ධන අංශය අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

මෙම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ නව නිර්මාණ 600 ක් සැලසුම් කිරීමට ඉලක්ක කළ අතර, ඒ යටතේ ප්‍රධාන කාර්යාලයේ හා නත්තරම්පොත ශාඛා කාර්යාලයේ මෝස්තර සංවර්ධන අංශය මඟින් නව නිර්මාණ 427 ක් සපුරා ගැනීමට හා තිරසාර ඇසුරුම් ප්‍රවර්ධනය කිරීමේ නව ඇසුරුම් නිර්මාණ ව්‍යාපෘතිය යටතේ නව නිර්මණ සැලසුම් 122 ක් සැලසුම් කිරීමට කටයුතු කර ඇත.

එසේ සැලසුම් කරන ලද නව නිර්මාණ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහලට හඳුන්වාදෙන අතර, වැඩහල තුළ ඒවා මූලික සාම්පල් භාණ්ඩ බවට පත් කරනු ලබයි. ඒ යටතේ සැලසුම් කරන ලද නව නිර්මාණ 427 න් 354 ක් හා තිරසාර ඇසුරුම් ප්‍රවර්ධනය කිරීමේ නව ඇසුරුම් නිර්මාණ ව්‍යාපෘතිය යටතේ නව නිර්මණ සැලසුම් 122 ක් වැඩහල වෙත හඳුන්වා දී ඇත. ඊට අමතරව බාහිර ශිල්පීන්ගේ අවශ්‍යතාවය හා ඉල්ලීම මත නව නිර්මාණ 53 ක් සැලසුම් කර ඔවුන්ට හඳුන්වා දීමට කටයුතු කර ඇත.

පහත ආකාරයට එක් එක් හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා ආයතනයේ වැඩහල වෙත නව නිර්මාණ සැලසුම් ලබාදීමට මෝස්තර සංවර්ධන අංශය කටයුතු කර ඇත.

අංක	වැඩහල ඒක් ඒක් හස්ත කර්මාන්ත අංශය සඳහා හඳුන්වා දීමට නව නිර්මාණ සැලසුම් කිරීම	සැලසුම් කළ නිර්මාණ ප්‍රමාණය
01	දැව අංශය	53
02	රෙදිපිළි අංශය	74
03	උණ හා වේවැල් අංශය	47
04	රතු මැටි අංශය	32
05	කොහු අංශය	41
06	ආභරණ අංශය	26
07	පන් හා කෙදි අංශය	31
08	සම් අංශය	43
09	පිත්තල තහඩු අංශය	19
10	පිත්තල වාත්තු අංශය	29
11	ලාක්ෂා අංශය	56
12	බතික්	19
13	තිර රාමු මුද්‍රණය	06

	ක්‍රියාකාරී සැලැස්ම යටතේ වැඩහල වෙත හඳුන්වා දී ඇති නව නිර්මාණ සංඛ්‍යාව	
	- වැඩහල වෙත හඳුන්වා දී ඇති නව නිර්මාණ සංඛ්‍යාව	354
	- බාහිර ශිල්පීන්ගේ අවශ්‍යතා හා ඉල්ලීම මත නිර්මාණ සංඛ්‍යාව	73
	තිරසාර ඇසුරුම් ප්‍රවර්ධනය කිරීමේ නව ඇසුරුම් නිර්මාණ ව්‍යාපෘතිය යටතේ සැලසුම් කල නව නිර්මාණ සංඛ්‍යාව	122
	සැලසුම් කරන ලද මුළු නිර්මාණ සංඛ්‍යාව	549

නව නිර්මාණ මූලාදර්ශ (සාම්පල් භාණ්ඩ) බවට පරිවර්ථනය කිරීම

සැලසුම් කළ නව නිර්මාණ අතුරින් තෝරා ගත් නිර්මාණ, මොරටුව හා නත්තරම්පොත කාර්යාල පරිශ්‍රය තුළ පිහිටි වැඩහල් හරහා මූලාදර්ශ බවට පත් කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ශිල්ප උපදේශක උපදේශිකාවන් විසින් කටයුතු කරනු ලබයි. පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව සහ ආභරණ යන ක්ෂේත්‍ර යටතේ සැලසුම් කල නව නිර්මාණ මොරටුව වැඩහල තුළ මූලාදර්ශ බවට සකස් කරන අතර, සම්, පිත්තල, බතික් හා ලාක්ෂා යන අංශයන්ගේ මූලාදර්ශ නත්තරම්පොත වැඩහල තුළ සකස් කරනු ලබයි.

මෙසේ සකස් කරන ලද නව නිර්මාණ හා මූලාදර්ශ, ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් දිවයින පුරා විවිධ හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර යටතේ සංවිධානය කරන නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන් හරහා, හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ විවිධ වැඩසටහන් වෙනුවෙන් ඉල්ලීම් කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, පළාත් සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යන විවිධ ආයතනයන් සම්බන්ධ කරගනිමින් හා නව නිර්මාණ ප්‍රදර්ශන, අලෙවි සල්පිල් හා විවිධ සේවා ලබා ගැනීම වෙනුවෙන් ආයතනය වෙත පැමිණෙන ශිල්පීන් හරහා හඳුන්වාදීම සිදු කරනු ලබයි.

ආයතනයේ වැඩහල් තුළ නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්ථනය කිරීම යටතේ 2022 වර්ෂයේ සැලසුම් කර වැඩහල වෙත හඳුන්වාදෙන ලද නව නිර්මාණයන්ගෙන් මූලාදර්ශ 400 ක් සකස් කිරීමට ඉලක්ක කළ අතර, එම ඉලක්කය යටතේ නව නිර්මාණ මූලාදර්ශ 221 ක් හා තිරසාර ඇසුරුම් ප්‍රවර්ධනය කිරීමේ නව ඇසුරුම් නිර්මාණ ව්‍යාපෘතිය යටතේ සාම්පල 122 ක් සකස් කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

එක් එක් ක්ෂේත්‍රයන්ගෙන් වැඩහල වෙත හඳුන්වා දුන් නව නිර්මාණ පහත ආකාරයට මූලාදර්ශ බවට පත් කිරීමට කටයුතු කරන ලදී.

මෙහිදී මොරටුව ප්‍රධාන කාර්යාලයේ වැඩහල තුළ නව නිර්මාණ 214 ක් නත්තරම්පොත ශාඛා කාර්යාලයේ වැඩහල තුළ නව නිර්මාණ 129 ක් මූලාදර්ශ බවට පත් කිරීමට කටයුතු කර ඇත.

අංක	හස්ත කර්මාන්ත අංශය	මූලික සාම්පල සංඛ්‍යාව	එකතුව
ප්‍රධාන කාර්යාලය			**214**
01	දැව අංශය	50	
02	රෙදිපිළි අංශය	43	
03	ලණු හා වේවැල් අංශය	35	
04	රතුමැටි අංශය	25	
05	කොහු අංශය	28	
06	ආභරණ අංශය	11	
07	පන් හා කෙදි අංශය	22	
නත්තරම්පොත කාර්යාලය			**129**
01	සම් අංශය	37	
02	පිත්තල තහඩු අංශය	24	
03	පිත්තල වාත්තු අංශය	25	
04	ලාක්ෂා අංශය	43	
	මුළු නව නිර්මාණ මූලාදර්ශ සංඛ්‍යාව		**343**

නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම

- **ක්‍රියාකාරී සැලැස්ම යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සංවිධානය කර පවත්වන ලද වැඩසටහන්**

  ආයතනයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ, දැනුම්වත් කිරීම්, මූලික පුහුණු වැඩසටහන්, උසස් පුහුණු වැඩසටහන්, උපදේශාත්මක වැඩසටහන් ඇතුළුව නව නිර්මාණ හඳුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 19 ක් පැවැත්වීම හා ඒ තුළින් ප්‍රතිලාභීන් 322 ක් පුහුණු කිරීමට ඉලක්ක කරන ලදී.

ඒ අනුව පහත සඳහන් ආකාරයට 331 දෙනෙකු සඳහා පුහුණුව ලබා දෙමින් නව නිර්මාණ හා නව තාක්ෂණය හඳුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 18 ක් සංවිධානය කර පවත්වන ලදී.

ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රාග්ධන ප්‍රතිපාදන මගින් සිදුකරන ලද නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන්

	අදියර	වැඩසටහනේ ස්වභාවය (Awareness, New Design, New Technology, New commer, TOT)	හස්තකර්මාන්ත ක්ෂේත්‍රය	ආරම්භක දිනය හා පැවැත්වූ දින ගණන	දිස්ත්‍රික්කය,ප්‍රා.ලේ. කො. හා පැවැත් වූ ස්ථානය	ශිල්පීන් ගණන	නිලධාරියා
01		නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන - ගුරු පුහුණු	රතු මැටි	පෙබරවාරි 21 දින 4	කොළඹ - මොරටුව ජා. මෝ. ම.	21	සුමේද මයා - පෙ.මෝ.ස.
02		උසස් තාක්ෂණික වැඩසටහන	ස්ක්‍රීන් මුද්‍රණය	අගෝ. 03 දින 03	මහනුවර - කුන්ඩසාලේ - නත්තරම්පොත	18	උදයංග මයා - පෙ.මෝ.ස.
03		උසස් තාක්ෂණික වැඩසටහන	ස්ක්‍රීන් මුද්‍රණය	අගෝ. 03 දින 03	මහනුවර - ගඟවටකෝරලය - නත්තරම්පොත	17	උදයංගමයා - පෙ.මෝ.ස.
04		නවනිර්මාණ මූලික පුහුණු වැඩසටහන්	රෙදිපිලි ආශ්‍රිත	අගෝ. 19 දින 04	කොළඹ - බණ්ඩාරගම හම්බන්තොට	20	තමරා දමයන්ති මිය - ස.අ. (මෝ.ස.)
05	1	නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	පන් හා කෙඳි	සැප්. 16 දින 03	හම්බන්තොට වීරවිල	20	අධිකාරී මයා - මෝ.ස.
	2			නොවැ. 9- 10 දින 02			
06		නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	සම් රෙදි , රෙක්සින්	සැප්. 09 දින 03	මහනුවර - මැණික්හින්න - නත්තරම්පොත	12	පී.කේ. වීජේසිංහ මයා - ස.අ. (න. පොත)
07		නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	රෙදිපිලි හා ඇඟලුම්	සැප්.13 දින 03	අනුරාධපුරය - අනුරාධපුරය - තම්මැන්නාකුලම	17	උදයංග මයා - පෙ.මෝ.ස.
08		නවනිර්මාණ පුහුණු වැඩසටහන්	රෙදිපිලි - සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ	ඔක්.14 දින 04	කොළඹ - මොරටුව - කල්දෙමුල්ල	25	තමරා දමයන්ති මිය - ස.අ. (මෝ.ස.)
09		නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	හණ	නොවැ.23 දින 03	නුවරඑළිය - හගුරන්කොත	24	ජීවන්ත මාගමගේ මයා - මෝ.ස.
10		නවනිර්මාණ පුහුණු වැඩසටහන්	උණ ලී	නොවැ.09 දින 03	ගම්පහ - මීගමුව	10	පියරත්න මයා - ස.අ. (මෝ.ස.)
11		නවනිර්මාණ පුහුණු වැඩසටහන්	දැව	දෙසැ. 05 දින 03	පුත්තලම - හලාවත	17	බර්නාඩ් මනතුංග මයා - ස.අ. (මෝ.ස.)
12		නවනිර්මාණ පුහුණු වැඩසටහන්	දැව	දෙසැ. 14 දින 05	මාතර - දෙවිනුවර	14	බර්නාඩ් මනතුංග මයා - ස.අ. (මෝ.ස.)
13		නවනිර්මාණ පුහුණු වැඩසටහන්	විසිතුරු	දෙසැ. 12 දින 05	මහනුවර - පන්විල	26	සුමේද පෙරේරා මයා - පෙ.මෝ.ස.

14		නවනිර්මාණ පුහුණු වැඩසටහන්	රෙදිපිලි	දෙසැ.12 දින 03	ගම්පහ - ගම්පහ	25	තමරා දමයන්ති මිය - ස.අ. (මෝ.
15		නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	උණ හා වේවැල්	දෙසැ.16 දින 03	මාතර - කඹුරුපිටිය	14	පියරත්න මයා - ස.අ. (මෝ.ස.)
16		නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	අත්යන්ත්‍ර රෙදි ,රෙකසීන්	දෙසැ.21 දින 04	මහනුවර - පූජාවිටිය	16	පී.කේ. වීජේසිංහ මයා - ස.අ. (න. පොත)
17		උසස් තාක්ෂණික වැඩසටහන	(ජාවා) බතික්	දෙසැ.20 දින 04	මහනුවර - කුණ්ඩසාලේ	16	උදයංග මයා - ජෙ.මෝ.ස.
18		උසස් තාක්ෂණික වැඩසටහන	බතික්	නොවැ.29 දින 04	කෑගල්ල - රඹුක්කන	19	උදයංග මයා - ජෙ.මෝ.ස.

- **රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම**

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන්ට හා ක්ෂේත්‍රය සඳහා ඇල්මක් දක්වන නවක තරුණ කණ්ඩායම් සඳහා මෙහිදී පහත සඳහන් පරිදි පුහුණු වැඩසටහන් සංවිධානය කර පවත්වන ලදී. වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ හඳුන්වාදීම හා නව තාක්ෂණික දැනුම ලබාදීම සඳහා මූලික හා උසස් වශයෙන් පුහුණු වැඩසටහන් සිදු කරන ලදී.

	වැඩසටහනේ ස්භාවය	**හස්තකර්මාන්ත ක්ෂේත්‍රය**	**ආරම්භක දිනය හා පැවැත්වූ දින ගණන**	**දිස්ත්‍රික්කය, ප්‍රා.ලේ.කොට්ඨාස හා පැවැත්වූ ස්ථානය**	**ශිල්පීන් සංඛ්‍යාව**	**ඉල්ලීම් කරන ලද ආයතනය**	**නිලධාරියා**
1	නව තාක්ෂණික වැඩසටහන අදියර 01	උණ ලී	ජනවාරි දින 01	ගම්පහ-මීරිගම-හලුගම	35	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මීරිගම	පියරත්න මයා ස.අ. (මෝ.ස.)
	නව නිර්මාණ පුහුණු වැඩසටහන අදියර 02		ජනවාරි දින 04				
2	අත්කම් නිර්මාණ වැඩසටහන	විවිධ	මාර්තු 28 දින 05	කොළඹ- මොරටුව - කටුබැද්ද	15	එම්.ජේ.එෆ් ආයතනය	මෝස්තර අංශය හා වැඩහල-ප්‍රධාන කාර්යාලය
3	බතික් නව නිර්මාණ සැලසුම් කිරීම	බතික්	ජූලි 27 -දින 2	මාතලේ අඹන්ගහකෝරලය-හුණුකැටය	11	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අඹන්ගහ	උදයංග මයා - ජෙ.මෝ.ස.
4	නව නිර්මාණ මුලික පුහුණු වැඩසටහන	බතික් ආශ්‍රිත ආභරන නිර්මාන	අගෝ .19 දින 02	මහනුවර-- ගඟවටකෝරලය - සරසවිගම-මහකන්ද	26	කුඩා ව්‍යාපාර සංවර්ධන දෙපා.	උදයංග මයා - ජෙ.මෝ.ස.
5	උසස් තාක්ෂණික වැඩසටහනTOT	පන් හා කෙඳි	අගෝ.24 දින 05	පුත්තලම-නවගත්තේගම-ආනමඩුව	15	**SOUTH ASIA PARTHERSHIP SRI LANKA**	අධිකාරි මයා - .මෝ.ස.

6	නව තාක්ෂණික වැඩසටහන	බතික්	සැප්. 05 - දින 03	කොළඹ- මොරටුව - කටුබැද්ද	8	ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය	උදයංග මයා - ජෙ.මෝ.ස.
7	උසස් තාක්ෂණික වැඩසටහනTOTදිවයින ආවරණයවනපරිදි - අදියර 01 අදියර 02	රෙදිපිලි හාඇඟලුම්	සැප්. 24 - දින 06 ඔක්. 8,9 සහ 15,19 -දින 04	මහනුවර- මැණික්හින්න- නත්තර	36	වෘත්තීය පුහුණු අධිකාරිය	උදයංග මයා - ජෙ.මෝ.ස.
	නව නිර්මාණ දැනුවත් කිරීමේ වැඩසටහන	ලාක්ෂා	මාර්තු 24 - දින 01	මාතලේ - රත්තොට -හපුවිද	26	පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව	ජීවන්ත මයා- ජෙ.මෝ.ස.
	දැනුවත් කිරීමේ වැඩසටහන	කොහු	අගෝ.24 දින 01	කළුතර - වාද්දුව	08	ජාතික ශිල්ප සභාව	බර්නාඩ් මනතුංග මයාස.අ. (මෝ.ස.)

2022 වර්ෂය තුළ විවිධ පාර්ශවයන්ගේ ඉල්ලීම් හා ප්‍රතිපාදන මත නව නිර්මාණ හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන් 09ක් සහ ප්‍රතිලාභීන් 180 ක් ඉලක්ක කරන ලද අතර, ඒ යටතේ, ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 07ක් දිවයිනේ විවිධ ප්‍රදේශ තුළ සිදු කරමින් ප්‍රතිලාභීන් 180 දෙනෙකු සඳහා වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ හඳුන්වාදීම හා නව තාක්ෂණික දැනුම ලබාදීම සිදුකරන ලදී.

❖ ජාතික මෝස්තර මධ්‍යස්ථාන වැඩහල තුළ පුහුණුව ලබාදීම

විශ්ව විද්‍යාල සිසුන්, පාසල් සිසුන්, හස්ත කර්මාන්ත ශිල්පීන් හා ක්ෂේත්‍රයට ඇල්මක් ඇති නවකයින්ගේ ඉල්ලීම මත ජාතික මෝස්තර මධ්‍යස්ථාන වැඩහල තුළ විවිධ හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර ඔස්සේ, එනම් පන් හා කෙදි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව සහ ආභරණ යන ක්ෂේත්‍ර මූලික කොට පුහුණුව ලබාදීම මොරටුව වැඩහල තුළ ද සම්, පිත්තල හා ලාක්ෂා යන අංශ සඳහා ඉල්ලීම් කරන්නන් සඳහා පුහුණුව ලබාදීම නත්තරම්පොත වැඩහල තුළ ද සිදු කරනු ලබයි.

ඒ අනුව වර්ෂය තුළ 75 දෙනෙකු සඳහා වැඩහල් පුහුණුව ඉලක්ක කල අතර, ඒ යටතේ 51 දෙනෙකු සඳහා එම පුහුණුව ලබාදෙන ලදී.

❖ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හඳුන්වාදීම

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය තුළ වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීම, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන අතර, එසේ සැලසුම් කර වැඩහලට හඳුන්වාදෙනු ලබන නව නිර්මාණ මූලාදර්ශ බවට පත් කිරීමෙන් අනතුරුව විවිධ වැඩසටහන් ඔස්සේ හස්ත කර්මාන්ත ශිල්පීන්ට හඳුන්වාදීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියා කරයි. ක්‍රියාකාරී සැලැස්ම යටතේ දිවයින පුරා විවිධ හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර මූලික කොට සංවිධානය කරන නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන්, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන හා ඉල්ලීම යටතේ සිදුකරනු ලබන නව නිර්මාණ පුහුණු වැඩසටහන් හරහා මෙන්ම ආයතනයේ වැඩහල් වෙත පැමිණ පුහුණුවීම් ලබන්නන් හරහා ශිල්පීන්ගේ ඉල්ලීම් හා අවශ්‍යතාවය මත ලබාදෙන නව නිර්මාණ සැලසුම් මඟින් හා පළාත් සභා,

අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හරහා සිදු කරන වැඩසටහන් හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ 500ක් මෙම වර්ෂයේදී හඳුන්වාදීමට ඉලක්ක කළ අතර, ඒ යටතේ නව නිර්මාණ 189ක් සත්‍ය වශයෙන් හස්ත කර්මාන්ත ශිල්පීන්ට හඳුන්වාදීමට කටයුතු කර ඇත.

❖ <u>හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ එක් දින දැනුම්වත් කිරීමේ වැඩසටහන්</u>

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් පාසල් සිසුන්, පාසල් ගුරුවරුන් මෙන්ම විශ්වවිද්‍යාල සිසුන් ජාතික මෝස්තර මධ්‍යස්ථානයට නිරතුරුව පැමිණේ. මෙම වර්ෂයේ 500 දෙනෙකු සඳහා මෙම සේවාව ලබාදීමට ඉලක්ක කළ අතර, 490 දෙනෙකු සඳහා එක් දින දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වමින් ඔවුන්ට අවශ්‍ය දැනුම ලබාදෙන ලදී.

❖ <u>පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්</u>

දේශීය හස්ත කර්මාන්ත සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය සඳහා ආදේශන සොයා ගැනීම, කාර්යක්ෂම හා ඵලදායි නිෂ්පාදන ක්‍රියාවලීන් පිළිබඳ හා ඒ ආශ්‍රිත නව යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම, ඒ ආශ්‍රිත සොයා ගැනීම් හා විසඳුම් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට මුදා හැරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ පර්යේෂණ හා සංවර්ධන අංශය හරහා සිදුකරනු ලබයි.

ඒ යටතේ 2021 වර්ෂයේ සිදුකරනු ලැබූ ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

1) <u>බතික් කර්මාන්තය සඳහා සුදුසු ප්‍රමිතිකරණ පද්ධතියක් සකස් කිරීමට කටයුතු කිරීම</u>

බතික් කර්මාන්තයෙහි ගුණාත්මකභාවය තහවුරු කල හැකි ප්‍රමිතිකරණ පද්ධතියක් ලංකාව තුල නොතිබුණු අතර එම අවශ්‍යතාවය බතික් කර්මාන්තකරුවන් තුලද පවතින බව පර්යේෂණ අංශය මගින් පෙර කරන ලද සමීක්ෂණ තොරතුරු වලින් පෙනී යන ලදි. එබැවින් මෙම ව්‍යාපෘතිය ජාතික විද්‍යා පදනමෙහිද සහයෝගය සහිතව ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව බතික් කර්මාන්තය සඳහා සුදුසු ප්‍රමිතිකරණ පද්ධතියක් හඳුනාගැනීමට මෙම කාර්යයෙහි නියැලෙන රජයේ සහ පුද්ගලික ආයතන මගින් තොරතුරු රැස් කරගන්නා ලදි. ශ්‍රී ලංකාව තුල ප්‍රමිතිකරණ පද්ධති ස්ථාපනය කිරීමේ අධිකාරියක් ඇති ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව බතික් සඳහා විධිමත් නිෂ්පාදන ක්‍රියා පිළිවෙත් නමැති ප්‍රමිති කෙටුම්පත සකස් කිරීම ආරම්භ කරන ලදි. මෙහිදී බතික් කර්මාන්තයෙහි නියැලෙන ස්ථාන කිහිපයක් අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා වල යෙදුණු අතර ඒ සඳහා අප ආයතනය, ජාතික විද්‍යා පදනම සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සම්බන්ධ විය. ප්‍රමිති කෙටුම්පත සකස් කිරීමේ කාර්යය සඳහා ආයතන කිහිපයක් සම්බන්ධ වූ අතර මෙහි ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයෙකු ලෙස මෙම කෙටුම්පත ඉංග්‍රීසි සහ සිංහල යන භාෂා දෙකෙන්ම සකස් කිරීම සඳහා ජා.මෝ.ම. පර්යේෂණ අංශයද ක්‍රියා කරන ලදි. එය ප්‍රමිතියක් ලෙස ප්‍රකාශනය සඳහා අදාළ අනුමැතිය ලබාගැනීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

2) <u>තල්කොළ ආශ්‍රිත අත්කම් භාණ්ඩ මත දිලීර වර්ධනය පාලනය කිරීමට අදාළ ක්ෂේත්‍ර අධ්‍යයන පැවැත්වීම</u>

තල්කොළ භාණ්ඩ මත දිලීර වර්ධනය සහ එම භාණ්ඩ අවපැහැ වීම ඒ ආශ්‍රිත කර්මාන්තකරුවන් මුහුණදෙන එක් ගැටලුවකි. ඒ සඳහා විවිධ පර්යේෂණ සිදුකළද මේ වනතෙක් සම්පූර්ණ විසඳුමක් ලැබී නොතිබුණි. එබැවින් මෙම ගැටලුවට විසඳුම් සෙවීමේ අරමුණ සහිතව දිලීර නාශක දියර සැකසීම පිලිබඳව කරන ලද පර්යේෂණ වල තොරතුරු සොයන ලදි. ඒ අනුව හඳුනාගත් ආරක්ෂිත දිලීර නාශක දියරයක් තල්කොළ භාණ්ඩ මත අලේප කර ලද නිරීක්ෂණ වලින් අනතුරුව එම කාර්යය ක්ෂේත්‍රය තුළ අත්හදා බලන ලදි. ඒ සඳහා වීරවිල ප්‍රදේශයේ තල්කොළ කර්මාන්තයේ නියැලෙන පිරිසක් තෝරාගත් අතර එම දිලීර නාශක දියර නිපැයුම්කරුද සම්බන්ධ කරගනිමින් එය නිවැරදිව භාවිතා කරන ආකාරය පිලිබඳ දැනුම්වත් කිරීමක් සමඟ ක්ෂේත්‍ර අත්හදාබැලීමක් ලෙස වැඩමුළුවක් පවත්වන ලදි. මෙහි දත්ත කාලයත් සමඟ ලබාගත යුතු වන අතර මෙම කාර්යය වීරවිල තල් සංවර්ධන මණ්ඩලයෙහිද සහයෝගය මත ඉදිරියට සිදු කරගෙන යනු ලැබේ. මෙම පර්යේෂණය තවදුරටත් ක්‍රියාත්මක වේ.

3) <u>බතික් කර්මාන්තය සඳහා භාවිත කළ හැකි උසස් තත්වයේ පවතින වර්ණක හඳුනාගැනීමසහ ක්ෂේත්‍ර අධ්‍යයනය</u>

දැනට බතික් කර්මාන්තකරුවන් බහුලව භාවිතා කරනුයේ නැප්තෝල් සහ වැට් වර්ණක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ එම වර්ණක සැපයුම්කරුවන්ගෙන් ඒවා පිලිබඳ තොරතුරු රැස් කරන ලද අතර සුදුසු ගුණාත්මක තත්වයේ පවතින වෙනත් වර්ණක පිලිබඳ තොරතුරුද රැස්කරන ලදි. ඒ අනුව රියැක්ටිව් වර්ණක බතික් ක්‍රියාවලිය තුළ භාවිතා කළ හැකි විවධ ආකාරය අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් ලෙස බතික් කර්මාන්තකරුවන් සහ වර්ණක සැපයුම්කරුවන්ද සම්බන්ධ කර ගනිමින් දින දෙකක වැඩමුළුවක් පවත්වන ලදි. එහිදී අඩු උෂ්ණත්වයේදී ක්‍රියාත්මක වන රියැක්ටිවිඩයි භාවිතයෙන් වර්ණ කිහිපයක් ලබාගත් අතර ඒවායේ සාම්පල සහ තොරතුරු ඇතුලත් වාර්තාවක් සකසන ලදි.උසස් තත්වයේ පවතින වර්ණක බතික් කර්මාන්තයට හඳුන්වාදීමේ අරමුණ සහිතව පවත්වන ලද මෙය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබේ.

4) <u>කොහු වර්ණ ගැන්වීමට විකල්ප වර්ණකයක් හඳුනාගැනීම සඳහා පර්යේෂණ සිදුකිරීම</u>

දැනට කොහු වර්ණ ගැන්වීම සඳහා භාවිතා කරනු ලබන්නේ ඉහළ උෂ්ණත්වයේදී ක්‍රියාත්මක වන රසායනික ඩයි වර්ගයකි. මෙම පර්යේෂණයේදී කොහු වර්ණ ගැන්වීම සඳහා සාමාන්‍ය උෂ්ණත්වයේදී භාවිතා කළ හැකි වෙනත් ඩයි වර්ගයක් හඳුනා ගැනීමට හැකි විය. එම ඩයි භාවිතා කරමින් විවිධ වර්ණ ලබාගැනීමට අදාළ අමුද්‍රව්‍ය වට්ටෝරු හඳුනාගන්නා ලදි. මෙම වර්ණක වල ගුණාත්මක භාවය පිලිබඳ තොරතුරුද රැස් කරගන්නා ලදි. මෙමඟින් කොහු වර්ණ ගැන්වීමට බලශක්තිය සඳහා වැයවන පිරිවැය ඉවත්කර ගත හැකි අතර මෙම පර්යේෂණයේ ප්‍රතිඵල අනුව එම අමුද්‍රව්‍ය කොහු වර්ණ ගැන්වීමේ විකල්ප අමුද්‍රව්‍යයක් ලෙස ක්ෂේත්‍රය තුළ අත්හදා බැලීමේ හැකියාව පවතියි..

5) <u>ජල පිරිපහදුවේදී සෑදෙන ඝන අපද්‍රව්‍ය අත්කම් නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් ලෙස හඳුන්වාදීමට ඇති හැකියාව පිලිබඳ පර්යේෂණ සිදුකිරීම</u>

මෙම ව්‍යාපෘතිය පෙර වසරෙහිදී ආරම්භ කරන ලද්දක් වන අතර මෙම අමුද්‍රව්‍ය අත්කම් නිෂ්පාදන සඳහා යෙදිය හැකි ආකාරය පිලිබඳ පර්යේෂණ අංශයෙන් ලද ප්‍රතිඵල ජාතික ශිල්ප සභාවටද යොමුකරන ලදි. දැනට මැටි අත්කම් නිෂ්පාදනයෙහි නියැලෙන කර්මාන්තකරුවන්ට ආදේශක අමුද්‍රව්‍යයක් ලෙස මෙය හඳුන්වාදීමට ඇති හැකියාව පිලිබඳ සොයාබලන ලදි. ඒ අනුව මැටි පහන් නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් සඳහා මෙම අමුද්‍රව්‍ය හඳුන්වාදීමට ඇති හැකියාව හඳුනාගත් අතර මැටි සාම්පල ගම්මාන වෙතට ලබාදෙමින් එය තම කර්මාන්තය සඳහා භාවිතා කිරීම අත්හදා බැලීමට පහසුකම් සලසන ලදි. උක්ත කාර්යයන් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය වෙමින් ව්‍යාපෘතිය මෙහෙයවන ලදි.

නිෂ්පාදන ශිල්ප ක්‍රම, නව යන්ත්‍ර සූත්‍ර, මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය සහ නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් හඳුන්වා දීම.

<u>පර්යේෂණ හා සංවර්ධන ඒකකය - යාන්ත්‍රික අංශය</u>

මේ වන විට, අතින් ක්‍රියා කර සිදු කරනු ලබන ක්‍රම හරහා කොහු හා පන් සහ කෙඳි ආශ්‍රිත කර්මාන්තයන්ගේ භාවිතා වන ලණු පටි හා පන් කෙඳි පිරි සැකසීම් කටයුතු සිදු වේ. මෙය සැලකිය යුතු කාලයක් වැයවන, ගුණාත්මක බවින් හා ප්‍රමිතියෙන් අඩු කටයුත්තකි. එම නිසා, අපේක්ෂිත නිෂ්පාදනයන් සහ කාර්යක්ෂමතාවයකින් ඉහත ක්‍රියාවලීන් සිදු නොවේ. ඊට පිළියම් ලෙස පහත යන්ත්‍ර වැඩහල ක්ෂේත්‍රය වෙත හඳුන්වාදෙන ලදී.

01. අර්ධ ස්වංක්‍රීය කොහු ලණු පටි පිරිසැකසුම් කිරීමේ යන්ත්‍රය

මෙම යන්ත්‍රය මේ වන විට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල තුල කොහු ලණු පටි ආශ්‍රිත දෛනික ක්‍රියාවලීන් සඳහාත් ඒ ආශ්‍රිත පුහුණු ක්‍රියාවලීන් සඳහාත් භාවිතා වේ.

02. අර්ධ ස්වංක්‍රීය කොහු ලණු පටි පිරිසැකසුම් කිරීමේ යන්ත්‍රය

මෙම යන්ත්‍රය මේ වනවිට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල තුල පන් සහ කෙඳි ආශ්‍රිත දෛනික ක්‍රියාවලීන් සඳහාත් ඒ ආශ්‍රිත පුහුණු ක්‍රියාවලීන් සඳහාත් භාවිතා වේ.

අලෙවි අංශය හරහා සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

අත්කම් මාර්කට්- හස්ත කර්මාන්ත ආශ්‍රිත නව නිර්මාණ අලෙවි පොළ

හස්තකර්මාන්ත ශිල්පීන්ට වෙළඳපළ අවස්ථා උදාකරදීම සඳහා ජාතික මොස්තර මධ්‍යස්ථානය හා Colombo City Center(CCC) එක්ව අත්කම් මාර්කට් නමින් හස්ත කර්මාන්ත නිෂ්පාදන අලෙවි පොළක් 2022 මාර්තු 26,27,28 දිනයන්හි Colombo City Centre පරිශ්‍රය තුළ සංවිධානය කරන ලදි.

මෙහිදි හස්ත කර්මාන්ත ශිල්පින් 09 දෙනෙක් සඳහා ඔවුන් විසින් සිදුකරනු ලබන නව නිර්මාණ අලෙවිය සඳහා අවස්ථාව සලසාදුන් අතර ඊට අමතරව ජාතික මොස්තර මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබන නව නිර්මාණ ද වෙළඳපළට හඳුන්වාදීමට හැකියාව ලැබිනි.

මෙම අලෙවි පොළ සඳහා පොල්කටු ආශ්‍රිත ආභරණ, බතික් ,ලේස් ,මැටි ,තල්කොළ, දැව ලාක්ෂා, උණ හා වේවැල් ,පිත්තල, කොහු යන සෑම හස්තකර්මාන්ත ක්ෂේත්‍රයක්ම නියෝජනය වන පරිදි නව නිර්මාණ ඉදිරිපත් කොට තිබීම විශේෂත්වයකි.

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන හරහා හස්ත කර්මාන්ත ආශ්‍රිත නව නිර්මාණ වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් සංවිධානය කරන ප්‍රදර්ශන හා සම්බන්ධවෙමින් හස්තකර්මාන්ත ආශ්‍රිත නව නිර්මාණ වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන් 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි. ඒ ඔස්සේ හස්තකර්මාන්ත නිෂ්පාදන නව නිර්මාණ පාර්භෝගිකයන්හට හඳුන්වාදීම, ඇණවුම් ලබාගැනීම, ගැනුම්කරුවන්ට හස්තකර්මාන්ත නිෂ්පාදන සිදුකරන ශිල්පීන් සම්බන්ධ කරදීම, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ පිළිබඳ පාරිභෝගික අදහස් ලබාගැනීම යන ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

ඒ අනුව 2022 වර්ෂය තුල ජාතික මෝස්තර මධ්‍යස්ථානය මගින් සම්බන්ධ වූ ප්‍රදර්ශන හා ප්‍රවර්ධන වැඩසටහන් පහත සඳහන් පරිදි වේ.

ප්‍රදර්ශනය	සංවිධානය කළ ආයතනය	පැවැත්වූ දිනයන්	ස්ථානය
බතික් නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන	කර්මාන්ත අමාත්‍යාංශය	මාර්තු 11	අමාත්‍යාංශ පරිශ්‍රය
අත්කම් මාර්කට්	කලම්බු සිටි සෙන්ටර්	මාර්තු 25-27	කලම්බු සිටි සෙන්ටර්

රන්සළු අත්යන්ත්‍ර රෙදි ආශ්‍රිත ප්‍රදර්ශනය හා අලෙවිපොළ 2021	පේෂකර්ම දෙපාර්තමේන්තුව	අප්‍රේල් 1-3	BMICH
රන්සළු අත්යන්ත්‍ර රෙදි පිළි ප්‍රදර්ශනය හා අලෙවිපොළ 2022	පේෂකර්ම දෙපාර්තමේන්තුව	දෙසැම්බර් 2-4	BMICH
Pro food pro pack Exhibition	අපනයන සංවර්ධන මණ්ඩලය හා ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය	නොවැම්බර් 18-20	BMICH
Sales Fair	කර්මාන්ත අමාත්‍යාංශය	දෙසැම්බර් 23	අමාත්‍යාංශ පරිශ්‍රය

<u>නව නිර්මාණ වෙළඳපොළට හඳුන්වා දීම හා හස්ත කර්මාන්ත ශිල්පීන්ට වෙළඳපොළ සම්බන්ධතා උදා කර දීම</u>

හස්තකර්මාන්ත නිෂ්පාදන අලෙවියෙහි නිරත රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා සම්බන්ධ වෙමින් සිදු කරන ලද අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා අනෙකුත් ආයතන සමග සම්බන්ධ වෙමින් පවත්වන ලද ප්‍රදර්ශන හරහා නව නිර්මාණ 130 ක ප්‍රමාණයක් වෙළඳපොළට හඳුන්වාදෙන ලද අතර හස්තකර්මාන්ත ශිල්පීන් 25 ක් සඳහා වෙළඳපොළ සම්බන්ධතා ගොඩ නගා දීම සිදු කරන ලදි.

❖ මෝස්තර උපදේශන සේවා

ගෘහ අභ්‍යන්තර සැලසුම්, ග්‍රැෆික් නිර්මාණ, තේමා ව්‍යූහයන්, කුසලාන, පදක්කම් හා සමරු ඵලක සහ වෙළෙඳ හා ප්‍රදර්ශන කුටි ආදිය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම පරිදි මෝස්තර උපදේශන සේවා සැපයීම යටතේ මෙම වර්ෂයේ කාර්යයන් 02 ක් සිදු කරන ලදී.

- සමෘද්ධි, ගෘහආර්ථික, ක්ෂුද්‍රමූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ SME One Stop Service Centre / Business Service Centre - නුවරඑළිය දිස්ත්‍රික් ව්‍යාපෘතිය සඳහා නිර්මාණ සැලසුම් & BOQ සකස් කිරීම

- එගොඩඋයන විහාරස්ථානය සඳහා නව ඉදිකිරීම් වලට අදාල නිර්මාණ සැලසුම් හා උපදේශන සේවා සැපයීම

එමෙන්ම, උපදේශන සේවා,හා බාහිර ආයතන සහ රේඛීය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන් මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 13 ක් සැලසුම් කිරීමට මෝස්තර හා සංවර්ධන අංශය කටයුතු කර ඇත.

❖ **තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය කටයුතු**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සිදු කෙරෙන නිත්‍ය කාර්යයන් හා විශේෂිත කාර්යයන් ප්‍රචලිත කිරීම උදෙසා ෆේස්බුක් සටහන් (සාමාන්‍ය) 103 ක් ෆේස්බුක් / යූ ටියුබ් වීඩියෝ 22 ක් හා ෆේස්බුක් බැනර් 33 ක් අන්තර්ජාලය හරහා මුදා හැරීමට කටයුතු කර ඇත.

අධ්‍යාපන අංශයේ ක්‍රියාකාරීත්වය
ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය යටතේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ අධ්‍යයන ආයතනය මඟින් ගෘහ අභ්‍යන්තර අලංකරන ඩිප්ලෝමා පාඨමාලාව, ගෘහඅභ්‍යන්තර අලංකරන උසස් ඩිප්ලෝමා පාඨමාලාව සහ ජීවන රටා නිමැවුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව යන පාඨමාලාවන් මඟින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ තරුණියන් හට න්‍යායාත්මක හා ප්‍රයෝගික දැනුම ලබා දෙමින් ඔවුන්ව වෘත්තීමය නිර්මාණකරුවන් ලෙස සවි බලගැන්වීමට කටයුතු කරයි.

ඉහත ගෘහ අභ්‍යන්තර අලංකරණ ඩිප්ලෝමා පාඨමාලාවන් කටුබැද්ද පරිශ්‍රයේ සතිඅන්ත පාඨමාලා ලෙස ආයතනය තුල ක්‍රියාත්මක වන අතර ජීවන රටා නිමැවුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව මහනුවර නත්තරම්පොත ශාඛාවේ පවත්වා ගෙන යනු ලැබේ. මෙම පාඨමාලාවන් හැදෑරීම තුලින් ලබාගන්නා න්‍යායාත්මක දැනුම යොදා ගනිමින් ස්වයං ව්‍යාපාර ආරම්භ කිරීමටත්, දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා උදා කර ගැනීමටත් ඔවුන්ට අවස්ථාව ලැබේ.

01. ගෘහ අභ්‍යන්තර අලංකරණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව -2021-2023 අන්ත සති

මෙම පාඨමාලාව සඳහා සිසුන් 65 දෙනෙකු 2021 වර්ෂයේ බඳවාගත් අතර එහි අධ්‍යයන කටයුතු මෙම වර්ෂයේදීද සිදු කෙරෙමින් පවතී.

02. ගෘහ අභ්‍යන්තර අලංකරන උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2021-2023 (සතිඅන්ත)

මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු 2021 වර්ෂයේ අග භාගයේ ආරම්භ කරන ලද අතර ඒ සඳහා සිසුන් 19 දෙනෙකු බඳවා ගන්නා ලදි. 2022 වර්ෂයේද එම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සිදු කෙරෙමින් පවතින අතර 2023 වසරේ අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

03. ජීවන රටා නිමැවුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2021 - 2022)සහිඅන්ත

මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු 2021 වර්ෂයේ මැද ආරම්භ කරන ලද අතර,සිසුන් 35 දෙනෙකු බඳවාගෙන 2022 වර්ෂයේ අග අවසන් කරන ලදි.

පාඨමාලා පිළිබඳ කරුණු -

1.අභ්‍යන්තර අලංකරණ ඩිප්ලෝමා පාඨමාලාව - කාලය මාස 18

2.අභ්‍යන්තර අලංකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - කාලය මාස 15

3.ජීවන රට නිමැවුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - කාලය මාස 12

ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය

අභ්‍යන්තර අලංකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව -2018-2020 පාඨමාලාව හා අභ්‍යන්තර අලංකරණ ඩිප්ලෝමා පාඨමාලාව -2019-2020 හදාරා සාර්ථකව නිම කල සිසුන් 70 දෙනකුට සහතික ප්‍රදානය කිරීමේ උත්සවය 2022.04.05 වන දින කොළඹ බන්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය - ලොටස් ශාලාවේදී පැවැත්වීමට කටයුතු යෙදුණි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන් සහ වැඩසටහන් හී ප්‍රගතිය ඇතුලත් සාරාංශගත වාර්තාව

නව මෝස්තර සහ නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දීම

ක්‍රියාකාරකම්	ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.)	වියදම (රු.මි)	ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI)	භෞතික	
				වාර්ෂික ඉලක්ක	ප්‍රගතිය
හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා නව නිෂ්පාදන / නව මෝස්තර සහ නිෂ්පාදන ක්‍රියාවලී වැඩි දියුණු කිරීමේ පුහුණුව	4.130	2.417	ජා.මෝ.ම.විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	19	18
			පුහුණුව ලැබූ ශිල්පීන් සංඛ්‍යාව	322	331
			හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා හඳුන්වා දෙනු ලැබූ නව නිර්මාණ සංඛ්‍යාව	500	189
	0.080	0.003	වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	9	7

ඉල්ලීම් මත නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම			පුහුණුව ලැබූ ශිල්පීන් සංඛ්‍යාව	180	180
ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය කිරීම සහ ඇගයීම	0.115	0.024	අධීක්ෂණය හා ඇගයීම් වැඩසටහන් සංඛ්‍යාව	2	1
මෝස්තර සංවර්ධනය, දැනුම යාවත්කාලීන කිරීම සහ කුසලතා සංවර්ධනය					
හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා වෙළඳපොලට ගැලපෙන නව නිර්මාණ හඳුන්වා දීම	...	...	නිර්මාණාත්මක නව මෝස්තර සංඛ්‍යාව	600	427
මූලික සාම්පල සකස් කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීම හා ආයතනයේ වැඩහල තුළ සකස් කළ නොහැකි සාම්පල බාහිර ශිල්පීන් හරහා සිදුකර ගැනීම.	1.550	0.680	සකස් කරන ලද නව මෝස්තර මූලික ආකෘති සංඛ්‍යාව	400	221
			සකස් කරන ලද අතිරේක සාම්පල සංඛ්‍යාව	50	55
ජා.මෝ.ම.වැඩහළ තුළ හස්ත කර්මාන්ත ශිල්පීන්ට/ ශිෂ්‍යයන් සඳහා පුහුණුවසැලසීම	…	…	ජා.මෝ.ම. වැඩහළ තුළ පුහුණු කරන ලද හස්ත කර්මාන්ත ශිල්පීන් / ශිෂ්‍යයන් සංඛ්‍යාව	75	51
ශිෂ්‍යයන් සහ උනන්දුවක් දක්වන පාර්ශ්ව සඳහා පොදු පහසුකම් සැලසීම සහ දැනුම්වත්කිරීමේ වැඩසටහන්	…	…	ශිෂ්‍යයන් සහ උනන්දුවක් දක්වන පාර්ශව සංඛ්‍යාව	500	490
හස්ත කර්මාන්ත ශිල්පීන්ට සහ ව්‍යවසායකයන්ට පුස්තකාල සේවා සැපයීම	…	…	පුස්තකාල සේවා ලබා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	50	17
පර්යේෂණ සහ සංවර්ධනය					
ශිල්පීය අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීම හා තත්ත්ව සහතික කිරීමේ යෝජනා ක්‍රමය සංවර්ධනය	...	...	නිමකිරීමේ ප්‍රතිශතය	50%	50%
ශිල්පීන් සඳහා රසායනික ආරක්ෂාව සහ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන	0.100	0.072	වැඩසටහන් සංඛ්‍යාව	1	1
			ප්‍රතිලාභීන් සංඛ්‍යාව	25	48
නත්තරම්පොත පිහිටි බතික් අපජලය පිරිපහදු කිරීමේ පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය	0.040	0.037	නිමකිරීමේ ප්‍රතිශතය	100%	100%
බතික් සඳහා රසායනික / ස්වභාවික ඩයි (වර්ණක) වර්ග පිලිබඳ පර්යේෂණ	0.040	0.036	නව සොයාගැනීම් සංඛ්‍යාව	2	1
නව තාක්ෂණය , නව ක්‍රියාවලි සහ ද්‍රව්‍යමය නවෝත්පාදන හඳුන්වා දීම					

දැනට පවත්නා පන් පදම් කිරීමේ යන්ත්‍රය සඳහා සියුම් වේග පාලන යාන්ත්‍රණයක් සැකසීම හා එය කොහු ලණු පටි තැලීමේ ක්‍රියාවලිය සිදුකිරීම සඳහා වැඩිදියුණු කිරීම	0.060	0.055	නිම කිරීමේ ප්‍රතිශතය	100%	100%
දැනට පවත්නා අතින් ක්‍රියාත්මක කරනු ලබන පන් පදම් කිරීම සඳහා භාවිතා කරන යන්ත්‍රයක් මෝටර් බලයෙන් ක්‍රියාත්මක කරන යන්ත්‍රයක් බවට වැඩි දියුණු	0.170	0.170	නිම කිරීමේ ප්‍රතිශතය	100%	100%
ජා.මෝ.ම.වැඩහල සඳහා නඩත්තු ක්‍රමෝපායන් හඳුන්වාදීම සහ ඒවා වැඩි දියුණු කිරීම	0.200	0.200	නිම කිරීමේ ප්‍රතිශතය	100%	100%
දේශීය වෙළෙඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් සහ නව නිර්මාණ ප්‍රදර්ශන පැවැත්වීම					
අනෙකුත් ආයතන සංවිධානය කරන ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය/ වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන් සහ වෙනත් වැඩසටහන්	1.000	0.501	නව මෝස්තර නිර්මාණප්‍රදර්ශන (වෙනත්) වැඩසටහන් සංඛ්‍යාව	6	7
			අලෙවිපර්යේෂණවැඩසටහන් සංඛ්‍යාව	4	1
			අලෙවි පර්යේෂණ වැඩසටහන් හරහා වෙළෙඳපොලට හඳුන්වාදෙනු ලබන නව නිර්මාණ සංඛ්‍යාව	125	130
හස්ත කර්මාන්ත ශිල්පින් සඳහා වෙළඳපොල හා සම්බන්ධවීමේ පහසුකම් සැලසීම			ස්ථාපිත වෙළඳපොල සබඳතා සංඛ්‍යාව	40	25
			අනෙකුත් ප්‍රදර්ශන / වෙළඳපල ප්‍රවර්ධන සහ වෙනත් වැඩසටහන් ඔස්සේ විකුණුම් වටිනාකම	රු.මි 1.000	රු.මි. 1.134
මෝස්තර උපදේශන සේවා					
මෝස්තර උපදේශන සේවා සැපයීම	බාහිර ප්‍රතිපාදන	බාහිර ප්‍රතිපාදන	සපයන ලද උපදේශක සේවා සංඛ්‍යාව	3	2
			මෝස්තර උපදේශක සේවා තුළින් ලද ලාභය	රු.මි 0.500	රු.මි . 0.248
ග්‍රැෆික් නිර්මාණය සහ අභ්‍යන්තර අලංකරණමෝස්තර නිර්මාණ කිරීම			ග්‍රැෆික් නිර්මාණ සහ සපයනු ලැබූ අභ්‍යන්තරඅලංකරණ මෝස්තර සංඛ්‍යාව	20	13
අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා හැකියා වර්ධන වැඩසටහන්					
කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන	0.215	0.172	පුද්ගලයන් සංඛ්‍යාව	90	82
මෝස්තර නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම					
නත්තරම්පොත අධ්‍යාපන අංශය සඳහා කාර්යාල උපකරණ	1.113 ඉපයීම් මත	...	ජීවන රටා නිමැවුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයන් සංඛ්‍යාව	40	35
අධ්‍යාපන අංශය ඔස්සේ දායකත්වය සැපයීම	…	...	අධ්‍යාපන අංශය තුලින් ලැබූ වර්ෂ අවසාන ආයතනික ගාස්තු	රු. මි. 1.000	රු. මි. 0.864

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් තත්ත්ව ප්‍රකාශය

	සටහන	31.12.2022 රු.	31.12.2021 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	16,309,772.34	13,352,709.61
වෙළඳ හා අනෙකුත් අයවිය යුතු දෑ	2	3,404,477.29	1,313,212.33
අවසන් තොගය	3	8,860,988.12	8,066,417.79
පෙරගෙවුම්	4	731,896.34	578,628.65
කාර්ය මණ්ඩල ණය	5	13,745,355.00	12,965,460.00
		43,052,489.09	36,276,428.38
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	**6**	170,825,503.40	142,526,128.38
		170,825,503.40	142,526,128.38
කෙරීගෙන යන වැඩ		62,595.00	-
අස්පෘශ්‍ය වත්කම්			
මෘදුකාංග		316,578.04	395,722.55
මුළු වත්කම්		214,257,165.53	179,198,279.31
වගකීම්			
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	7	4,346,918.92	10,049,449.74
UNDP වැඩසටහන සඳහා ලද අත්තිකාරම් මුදල්	8	2,312,227.97	2,312,227.97
උපචිත වියදම්	9	2,230,254.86	3,241,302.61
		8,889,401.75	15,602,980.32
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	10	26,763,675.50	25,334,414.50
මුළු වගකීම්		35,653,077.25	40,937,394.82
		178,604,088.28	**138,260,884.49**
මුළු ශුද්ධ වත්කම්			

ශුද්ධ වත්කම් / ස්කන්ධය
විලම්භීත ආදායම

ප්‍රාග්ධන ප්‍රදාන	11	109,431,667.13	110,949,206.31
ප්‍රත්‍යාගණන සංචිතය		45,117,114.29	6,578,345.91
සමුච්චිත ලාභය	12	24,055,306.86	20,733,332.27
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		**178,604,088.28**	**138,260,884.49**

පිටු අංක12 සිට 13 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක14 සිට 36 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනිවාර්ය කොටසකි.

බී ආර් රණවීර
ගණකාධිකාරී
17.04.2023

පී. කේ. එන්.අසංගිකා
අධ්‍යක්ෂක (වැ. බ.)
17.04.2023

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.
මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඩබ්ලිව්.ජී.කේ.බී රණතුංග
සභාපති
17.04.2023

පී.ජී.පී.රසාන්ජලි
මණ්ඩල සාමාජික
17.04.2023

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
මෙහෙයුම් ආදායම්			
භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන	13	67,380,000.00	72,664,000.00
භාණ්ඩාගාර ප්‍රදාන - සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන ප්‍රධාන		5,601,506.34	16,307,856.40
සංවර්ධන කටයුතු - අමාත්‍යාංශ අරමුදල්		818,715.71	8,981,300.00
වෙනත් ආදායම්	14	10,355,256.62	2,565,019.64
		84,155,478.67	100,518,176.04
මෙහෙයුම් වියදම්			
සේවක පඩිනඩි	15	56,442,225.51	56,320,049.89
ගමන් වියදම්	16	135,229.17	227,063.50
සැපයුම් සේවා	17	1,640,603.34	2,265,812.46
නඩත්තු කටයුතු	18	3,618,950.43	2,662,897.11
ගිවිසුම්ගත සේවා	19	6,176,349.55	6,723,493.46
ක්ෂයවීම්	20	11,761,315.51	10,168,003.08
පාරිතෝෂිකය		2,595,521.00	1,719,011.00
සංවර්ධන වියදම්	21	4,962,824.39	14,796,772.80
සංවර්ධන කටයුතු - අමාත්‍යාංශ අරමුදල්	22	307,630.00	8,981,300.00
වෙනත් වියදම්	23	4,266,427.75	1,392,749.15
		91,907,076.65	105,257,152.45
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල අතිරික්තය/හිඟය		(7,751,597.98)	(4,738,976.41)
<u>එකතු කළා</u> විලම්භිත ආදායම		11,075,032.84	9,641,949.71
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		**3,323,434.86**	**4,902,973.30**

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022		2021	
	රු.	රු.	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය				
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් අතිරික්තය/හිඟය	(7,751,597.98)		(4,738,976.41)	
(+) පෙර වර්ෂය සඳහා ගැලපීම්	376,487.24		59,837.75	
